# දුෂ්කර, අතිදුෂ්කර, හුදකලා පාසල් සිසුන් සඳහා පාවහන් තිළිණපත් ලබා දීමේ චක්‍රලේඛය

# 2018

අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය

ඉසුරුපාය

බත්තරමුල්ල.

අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி மற்றும் உயர் கல்வி அமைச்சு
Ministry of Education & Higher Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.

18, වෝඩ් පෙදෙස, කොළඹ 07.
18, வோட் பிளேஸ், கொழும்பு 7
18, Ward Place, Colombo 07.

මගේ යොමුව / எனது இல. / My Ref. ED/11/161/02/01

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2018.12.

චක්‍රලේඛ අංකය - 42/2018

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම විදුහල්පතිවරුන්,

**<u>දුෂ්කර, අතිදුෂ්කර, හුදකලා පාසල් සිසුන් සඳහා පාවහන් මිල දී ගැනීමට තිළිණපත් ලබා දීම</u>**

නිදහස් අධ්‍යාපන තවදුරටත් අර්ථවත් කරමින් අධ්‍යාපන ගුණාත්මකභාවය නංවාලීම පිණිස රජය විසින් බොහෝ ප්‍රදානයන් සිසු දරුවන් වෙත ලබා දෙනු ලැබේ. මෙම ප්‍රදානයන් තුළින් රජය අපේක්ෂා කරනුයේ අධ්‍යාපනයේ සම අවස්ථාවන් තහවුරු කරමින් සිසුදරුවන්ගේ අනාගතය ස්ථිරසාර කිරීමය. 2017 වර්ෂයේ දී මෙන්ම 2018 වර්ෂය සඳහාත් දුෂ්කර, අතිදුෂ්කර, හා හුදකලා පාසල් සිසුන් සඳහා පාවහන් තිළිණපත් ලබා දීමට කටයුතු කරන යන බව සතුටින් දන්වනු කැමැත්තෙමි. මෙම තිළිණපත උපයෝගී කරගෙන ගුණාත්මකභාවයෙන් යුතු පාවහන් යුගලක් මිලදී ගැනීමට හැකියාව ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

02. දුෂ්කර, අතිදුෂ්කර, හුදකලා පාසල් සිසුන් සඳහා පාවහන් ලබා දීම සම්බන්ධයෙන් මෙතෙක් පැවති සියලුම චක්‍රලේඛ අවලංගු කර 2018 වර්ෂය සඳහා පාවහන් තිළිණපත් ලබාදීම සම්බන්ධව මෙම චක්‍රලේඛය බල පැවැත්වේ.

03. මෙම චක්‍රලේඛය මඟින් ලබාදෙන උපදෙස්වලට අනුව <u>පාවහන් තිළිණපත් මේ සමඟ ලබාදෙන ලේඛනයේ සඳහන් පාසල් සඳහා පමණක්</u> ලබා දීමට කටයුතු කළ යුතුය. මෙම ලේඛනය සකසන ලද්දේ, 2018.05.08 දිනැති ලිපිය අනුව එක් එක් කලාපය විසින් නිල ඇඳුම් හා පාවහන් තිළිණපත් ලබාදීමට අදාලව පරිගණක ගත කරන ලද තොරතුරු පදනම් කරගෙනය.

04. 4.1 පාවහන් තිළිණපත් විස්තර

| අනු අංකය | ශ්‍රේණිය | වටිනාකම (රු.) |
|---|---|---|
| 01 | 1 ශ්‍රේණියේ සිට 3 ශ්‍රේණිය දක්වා | 1,200/= |
| 02 | 4 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා | 1,300/= |
| 03 | 6 ශ්‍රේණියේ සිට 9 ශ්‍රේණිය දක්වා | 1,400/= |
| 04 | 10 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා | 1,500/= |

4.2 2018 වර්ෂයේ පංති නාම ලේඛනයේ නම සඳහන් සිසුන්ට පමණක් පාවහන් තිළිණපත් නිකුත් කිරීම කෙරෙහි විදුහල්පතිවරු විශේෂ අවධානය යොමු කළ යුතුය.

05. කලාප අධ්‍යාපන කාර්යාලය වෙත තිළිණපත් නිකුත් කිරීම.

අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් කලාප කාර්යාලවලට තිළිණපත් නිකුත් කිරීම සඳහා SSV 01 ආකෘතිය භාවිතා කරනු ලැබේ. එකී ආකෘති පත්‍රය භාවිත කරමින් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් තම කලාපයේ ඇති සියලුම දුෂ්කර, අතිදුෂ්කර, හුදකලා පාසල්වලට අවශ්‍ය තිළිණපත් ප්‍රමාණය භාර ගත යුතුය. එම තිළිණපත් අමාත්‍යාංශ නිලධාරියකු මඟින් විධිමත් පරිදි කලාප අධ්‍යක්ෂ වෙත භාරදෙනු ඇත.

06. කලාප අධ්‍යාපන අධ්‍යකෂවරුන්ට විශේෂ උපදෙස්.

6.1 කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් නිල ඇඳුම් හා පාවහන් ලබාදීමට අදාලව 03 ඡේදයට අනුව පරිගණක ගත කරන ලද තොරතුරු වලට අනුව පාසල් ශිෂ්‍ය සංඛ්‍යාව පදනම් කරගෙන කලාපයට අයත් එක් එක් දුෂ්කර, අතිදුෂ්කර, හුදකලා පාසල්වලට අවශ්‍ය තිළිණපත් අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත සපයා දෙනු ඇත.

6.2 විවෘත වෙළඳපළින් පාවහන් තිළිණපත් සඳහා පාවහන් මිල දී ගැනීමට ඉඩ සලසා ඇති බැවින් අලෙවිකරුවන් ලියාපදිංචි කිරීම අවශ්‍ය නොවේ.

6.3 පාසල් අනුව වෙන්කර සකස්කර ඇති තිළිණපත් කලාප කාර්යාල වෙත ලැබුණු විගස පාසල්වලට බෙදාහැරීම සිදු කළ යුතුය.

6.4 SSV 02 ආකෘතිය අනුව තිළිණපත් විදුහල්පතිවරුන් වෙත ලබාදීමට කටයුතු කළ යුතුය.

07. පාසල්වලින් සිසුන්ට තිළිණපත් ලබා දීම සඳහා විදුහල්පතිවරුන්ට විශේෂ උපදෙස්.

7.1 කලාප අධ්‍යාපන කාර්යාල මඟින් පාසල්වලට SSV 02 මඟින් ලබාදෙන පාවහන් තිළිණපත් සුරක්ෂිතව තබාගෙන ශිෂ්‍යයන් වෙත නිවැරදිව ඉතා කඩිනමින් බෙදා දීම විදුහල්පතිවරුන්ගේ වගකීම වේ. මෙහිදී අංක 4.2 කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

7.2 බෙදාදුන් පාවහන් තිළිණපත්වල මුල කොටස විගණන කටයුතු සඳහා විධිමත්ව සුරක්ෂිතව තබා ගැනීමට වගබලා ගත යුතුය.

<u>පාවහන් තිළිණපතේ ආකෘතියකි</u>

| මුල් කොටස (පිළි පත) | සිසුවා වෙත නිකුත් කරන කොටස |
|---|---|

7.3 පාසලට ලැබෙන සියලුම තිළිණපත්වල විදුහල්පතිවරයාගේ නිල මුද්‍රාව තැබිය යුතුය. නිල මුද්‍රාව තැබීමේදී තිළිණපත පිටුපසෙහි ඒ සඳහා වෙන් කර ඇති කොටසේ පමණක් නිල මුද්‍රාව තැබීමට වගබලා ගත යුතුය.

7.4 නිල මුද්‍රාව තබන ලද තිළිණපත් එක් එක් පන්තියේ සිසුන්ට ලබා දීම සඳහා පන්තිභාර ගුරුභවතා වෙත භාරදිය යුතුය. පන්තිභාර ගුරුභවතා විසින් මෙම තිළිණපත් ලේඛනගත කර සිසු දරුවන්වෙත ලබා දී ඔවුන්ගේ අත්සන ලබා ගත යුතු අතර මේ සඳහා SSV 03 ආකෘතිය භාවිත කළ යුතුය.

7.5 1 සිට 5 දක්වා ශ්‍රේණිවල සිසුන්ගේ පාවහන් තිළිණපත් ලබාදීම සඳහා සුදුසු ක්‍රියාමාර්ගයක් අනුගමනය කිරීමට විදුහල්පති වගබලා ගත යුතුය.

7.6 තිළිණපතෙහි වටිනාකම සහ තිළිණපත් අංක පලුදු වුවහොත් එය අවලංගු වන බැවින් ඒ පිළිබඳ සැලකිලිමත්විය යුතුය.

7.7 මෙම තිළිණපත නිකුත් කිරීමෙන් පසුව එකී අත්සන් ලේඛනය ඉදිරි විගණන කටයුතු සඳහා පාසලේ සුරක්ෂිතව තබාගත යුතුය.

7.8 විදුහල්පතිවරයාට ලැබෙන සියලුම පාවහන් තිළිණපත් විධිමත්ව හා නිවැරදිව සියලුම සිසුන්ට ලබා දීම විනිවිදභාවයෙන් යුතුව ඉටුකිරීමට විදුහල්පතිවරයා බැඳී සිටින අතර ඊට අදාළ සියළුම ලේඛන විධිමත්ව සම්පූර්ණ කිරීමට ද කටයුතු කළ යුතුය.

7.9 තිළිණපතේ කාලය ඉකුත්වන දිනය ලෙස 2018.12.31 සටහන් වුවද එම දිනය 2019.02.28 දින දක්වා දීර්ඝ කරන බවට සිසුන් දැනුවත් කිරීමට විදුහල්පතිවරයා කටයුතු කළ යුතුය.

08. මෙම තිළිණපත්වලින් පාවහන් මිලදී ගැනීම සම්බන්ධව දෙමාපියන් දැනුවත් කිරීම විදුහල්පතිවරයාගේ කාර්යභාරයකි. නමුත් පාවහන් මිලදී ගැනීම සම්බන්ධයෙන් කිසිදු වෙළඳ නාමයක් හෝ වෙළඳසැලක් ප්‍රවර්ධනය කිරීමෙන් වැලකීමට විදුහල්පතිවරුන් තරයේ වගබලා ගත යුතුය.

09. පොදු කරුණු

9.1 විදුහල්පති විසින් පාසලට ලැබුණු තිළිණපත් සිසුන්ට නිකුත් කිරීමෙන් පසුව ඉතිරි තිළිණපත් නිවැරදිව ලේඛන ගත කොට කලාප කාර්යාලයට භාරදිය යුතුය. ඒසඳහා තිළිණපත් ආපසු භාර දීමේ ලේඛනය පිටපත් දෙකකින් යුතුව සකසා ගත යුතු අතර, තිළිණපත් අංකය, වටිනාකම, භාරදුන් සංඛ්‍යාව ආදි විස්තර ඊට ඇතුලත් විය යුතුය. මේ සඳහා SSV 04 ආකෘතිය භාවිත කළ යුතුය. තිළිණපත් භාර දුන් ලේඛනයේ පිටපතක් පාසලේ සුරක්ෂිතව තබා ගත යුතු අතර, අනෙක් පිටපත අදාළ තිළිණපත් සමග කලාප කාර්යාලයට භාර දිය යුතුය. තිළිණපත් ඉතිරිවීතිබුණ ද, නො තිබුණ ද, ඒ බැව් SSV 04 ආකෘතිය මඟින් කලාප අධ්‍යාපන කාර්යාලයට දැන්විය යුතුය. බෙදාදුන් සියලුම තිළිණපත්වල මුල් කොටස පාසලේ සුරක්ෂිතව තබා ගත යුතුය.

9.2 පාසල්වලින් කලාප අධ්‍යාපන කාර්යාලවලට ලැබුණු පාවහන් තිළිණපත් බෙදාදීමේ වාර්තා පිළිබඳව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සමීක්ෂණ කණ්ඩායමක් යොදවා අහඹු සමීක්ෂණයන් කළ යුතු බවට අවධාරණය කරමි. එය කළාප අධ්‍යක්ෂකගේ වගකීමකි. ඒ සඳහා ගුරුවරුන් හෝ වෙනත් නිලධාරීන් යොදා ගැනීමට කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා වෙත බලය පැවරේ. අදාල වාර්තාවේ පිටපතක් අධ්‍යාපන ලේකම් හා විගණකාධිපති වෙත ලබා දිය යුතුය.

9.3 තම කලාපයට අයත් සියලුම පාසල්වලින් ලබා ගන්නා තිළිණපත් බෙදා දීමෙන් අනතුරුව ලැබෙන වාර්තා ඇසුරෙන් අවසන් වාර්තාව කලාප කාර්යාලය මඟින් සකස් කළ යුතු අතර එය අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලබා දුන් උපදෙස් අනුව SSV 05 ආකෘතිය ඇසුරින් සකස්කර, SSV 06 ආකෘතිය ඇසුරින් ඉතිරි තිළිණපත් ද සමඟ එකවර 2019.01.31 ට පෙර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ, පාසල් සැපයීම් ශාඛාව, 4 මහල, අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල යන ලිපිනයට එවිය යුතුය. නැතිනම් අතින් ගෙනැවිත් භාරදිය යුතුය.

9.4 දුෂ්කර, අතිදුෂ්කර, හුදකලා පාසල්වල ඉගෙනුම ලබන සියලුම ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට 2019 නව පාසල් වාරය ආරම්භ කළ විගස පාවහන් තිළිණපත් ලබා දීම අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ හා රජයේ අපේක්ෂාවයි. එබැවින්, මේ පිළිබඳව විශේෂ අවධානය යොමු කොට 2019 නව පාසල් වාරය ආරම්භ කළ විගස තිළිණපත් ලබා දීමට අවශ්‍ය කටයුතු ඉටුකිරීම ඔබ සියලු දෙනාගේම වගකීම හා යුතුකම බව අවධාරණය කරනු කැමැත්තෙමි.

පද්මසිරි ජයමාන්න
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන ලේකම්

SSV 01

# 2018 පාසල් පාවහන් සඳහා තිළිණපත් බෙදාදීම.

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ

.......................................

2018 වර්ෂය සඳහා අංක ED/11/161/2/1(A) හා 2018.05.08 දිනැති පළාත් අධ්‍යක්ෂ වෙත යවන ලද ලිපිය ප්‍රකාරව පළාත් අධ්‍යක්ෂ විසින් ඔබ කලාපයට අයත් දුෂ්කර, අතිදුෂ්කර, හුදකලා පාසල් සඳහා ඉල්ලා ඇති පාවහන් ප්‍රමාණය වෙනුවෙන් පාවහන් තිළිණපත් පහත පරිදි සපයනු ලැබේ. එක් එක් ශ්‍රේණියේ ඉගෙනුම ලබන සිසුන් සංඛ්‍යාව අනුව අවශ්‍යතා ලබාගත් බැවින් ඒ අනුව SSV 01 සකසා ඇත.

| ශ්‍රේණිය | පාවහන් තිළිණපතේ වටිනාකම / ප්‍රමාණය | | | |
|---|---|---|---|---|
| | 1200 | 1300 | 1400 | 1500 |
| 1 ශ්‍රේණියේ සිට 3 ශ්‍රේණිය දක්වා | | | | |
| 4 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා | | | | |
| 6 ශ්‍රේණියේ සිට 9 ශ්‍රේණිය දක්වා | | | | |
| 10 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා | | | | |

SSV 01 පරිදි දුෂ්කර, අතිදුෂ්කර, හුදකලා පාසල්වල සිටින සිසුන් වෙත බෙදාහැරීම සඳහා පාසල් පාවහන් තිළිණපත් ප්‍රමාණය හා වටිනාකම ගණනය කර භාර ගතිමි.

ඉහත සඳහන් තිළිණපත් ප්‍රමාණය නිවැරදිව

භාර දුනිමි. භාර ගතිමි.

.......................................

.......................................

ලේකම් (වෙනුවට) කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ

අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය

නිල මුද්‍රාව නිල මුද්‍රාව

සැ.යු.-කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත පිටපතක් ලබා දිය යුතුය

SSV 02

## 2018 පාසල් පාවහන් සඳහා තිළිණපත් භාරදීම.

විදුහල්පති

.........................................

.........................................

2018 පාසල් පාවහන් සඳහා මුදල් තිළිණපත් ලබා දීම සඳහා ඔබගේ අංක ............................ හා ............................. දිනැති ලිපියේ සඳහන් පාසල් ශිෂ්‍ය සංඛ්‍යාව පදනම් කරගෙන පහත පරිදි පාවහන් සඳහා තිළිණපත් පංතිභාර ගුරුභවතා මඟින් සිසු දරුවන් වෙත බෙදා හැරීමට ඔබ වෙත භාර දෙමි.

පාසල් පාවහන් තිළිණපත් SSV 02 (අ)

| ශ්‍රේණිය | පාවහන් තිළිණපතේ වටිනාකම / ප්‍රමාණය | | | |
|---|---|---|---|---|
| | 1200 | 1300 | 1400 | 1500 |
| 1 ශ්‍රේණියේ සිට 3 ශ්‍රේණිය දක්වා | | | | |
| 4 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා | | | | |
| 6 ශ්‍රේණියේ සිට 9 ශ්‍රේණිය දක්වා | | | | |
| 10 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා | | | | |

පාසල් පාවහන් තිළිණපත් SSV 02 (ආ)

| වටිනාකම (රු.) | තිළිණපත් බෙදාහැරීම | | |
|---|---|---|---|
| | ආරම්භක අනුක්‍රමික අංකය | අවසාන අනුක්‍රමික අංකය | ප්‍රමාණය |
| 1200 | | | |
| 1300 | | | |
| 1400 | | | |
| 1500 | | | |
| එකතුව | | | |

ඉහත සඳහන් තිළිණපත් නිවරදිව භාර ගතිමි.

පාසල් පාවහන් තිළිණපත් 02 (අ) පරිදි නියමිත පංතිවල සිටින සිසුන් වෙත බෙදාහැරීම සඳහා පාසල් පාවහන් තිළිණපත් 02 (ආ) පරිදි දක්වා ඇති කුවිතාන්සිවලින් හා වටිනාකමින් යුත් තිළිණපත් ප්‍රමාණය ගණනය කර ;

භාර දුනිමි.

...................................

.........................................

කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂ/ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ

නිල මුද්‍රාව

භාර ගතිමි.

විදුහල්පති

දිනය:-

නිල මුද්‍රාව

SSV 03

# දුෂ්කර, අතිදුෂ්කර, හුදකලා පාසල්වලට පාවහන් සඳහා තිළිණපත් බෙදාදීමේ ලේඛනය - 2018

## පංති සාරාංශය

පාසලේ නම :-

ශ්‍රේණිය :-

| අනු අංකය | ශිෂ්‍යයාගේ/ ශිෂ්‍යයාවගේ නම | පංති නාම ලේඛනයේ නම තිබේද | තිළිණපත් | | භාරදුනිම් | භාර ගතිම් |
|---|---|---|---|---|---|---|
| | | | අංකය | වටිනාකම | ගුරුභවතාගේ අත්සන | ශිෂ්‍යයාගේ අත්සන |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |

..............................

ගුරු භවතාගේ
නම හා අත්සන

..............................

විදුහල්පතිගේ අත්සන
නිල මුද්‍රාව

SSV 04

## 2018 පාසල් පාවහන් තිළිණපත් බෙදාහැරීම හා ඉතිරි තිළිණපත් ආපසු භාරදීම

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ

.................................................................. විදුහලේ සිටින ........................................ ශිෂ්‍ය සංඛ්‍යාව පදනම් කොටගෙන සිසු දරුවන් වෙත බෙදා හැරීමට මා වෙත ලබාදුන් පාවහන් තිළිණපත් බෙදාහැරීමේ ලේඛනය (SSV 04) අනුව අනුක්‍රමික අංක සහිත ඉතිරි තිළිණපත් මේ සමඟ නිවැරදිව භාර දෙමි.

| තිළිණපතේ වටිනාකම (රු.) | ලද තිළිණපත් ප්‍රමාණය | බෙදාහරින ලද තිළිණපත් ප්‍රමාණය | ආපසු භාරදෙන තිළිණපත් ප්‍රමාණය |
|---|---|---|---|
| 1200 | | | |
| 1300 | | | |
| 1400 | | | |
| 1500 | | | |
| එකතුව | | | |

ඉතිරි තිළිණපත් ප්‍රමාණය (SSV 04 (අ))

අනුක්‍රමික අංක විස්තර සහිත ලේඛනය මේ සමඟ ඉදිරිපත් කරමි.

| | |
|---|---|
| භාර දුනිමි | භාර ගතිමි |
| ........................................ | .................................. |
| (නම හා අත්සන)<br>විදුහල්පති<br>නිල මුද්‍රාව | (නම හා අත්සන)<br>කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ<br>නිල මුද්‍රාව |

SSV 05

# පාසල් පාවහන් සඳහා තිළිණපත් බෙදාහැරීමේ ලේඛනය - 2018
## කලාප සාරාංශය

කලාපයේ නම -

පළාත -

| අනු අංකය | පාසලේ සංගණන අංකය | පාසලේ නම | සිසුන්ට ලබාදුන් මුළු තිළිණපත් සංඛ්‍යාව | ඉතිරි තිළිණපත් සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 1200 | 1300 | 1400 | 1500 |
| 1 | | | | | | | |
| 2 | | | | | | | |
| 3 | | | | | | | |
| 4 | | | | | | | |
| 5 | | | | | | | |
| 6 | | | | | | | |
| 7 | | | | | | | |
| 8 | | | | | | | |
| 9 | | | | | | | |

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ අත්සන

නිල මුද්‍රාව

SSV 06

## 2018 පාසල් පාවහන් තිළිණපත් බෙදාහැරීමේ ලේඛනය හා ඉතිරි තිළිණපත් ආපසු භාර දීම

ලේකම්,

අධ්‍යාපන අමාත්‍යාංශය

....................................කලාපයේ පාසල්හි පංතිවල ශිෂ්‍ය සංඛ්‍යාව පදනම් කොටගෙන සිසු දරුවන් වෙත බෙදාහැරීමට මා වෙත ලබාදුන් නිල ඇඳුම් තිළිණපත් බෙදාහැරීමේ සමස්ථ පාසල් සාරාංශ ලේඛනය සහ ඉතිරි තිළිණපත් ප්‍රමාණය සමඟ අනුක්‍රමික අංක විස්තර සඳහන් කර සැකසූ ඉතිරි තිළිණපත් ලේඛනය මේ සමඟ නිවැරදිව භාර දෙමි.

ඉතිරි තිළිණපත් ප්‍රමාණය (SSV 06)

| තිළිණපතේ වටිනාකම (රු.) | ලද තිළිණපත් ප්‍රමාණය | බෙදාහරින ලද තිළිණපත් ප්‍රමාණය | ආපසු භාරදෙන තිළිණපත් ප්‍රමාණය |
|---|---|---|---|
| 1200 | | | |
| 1300 | | | |
| 1400 | | | |
| 1500 | | | |
| එකතුව | | | |

අනුක්‍රමික අංක විස්තර සහිත ලේඛනය මේ සමඟ ඉදිරිපත් කරමි.

භාර දුනිමි

.........................................

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ

භාර ගතිමි

.................................

අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් වෙනුවට

දිනය -

පිටපත - පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ